<u>කර්මය හා එහි ප්‍රභේද හැඳින ගනිමු.</u>

- **සුදුසු පිළිතුර වරහන් තුළින් තොරා හිස්තැන් පුරවන්න**

1. බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සමයෙහි .....හට කර්මයේ ප්‍රභේද දක්වමින් .....සූත්‍රය දේශනා කළ සේක.
2. චේතනා හෙවත් සිතිවිලි මුල් කරගත් ක්‍රියා තුළින් පමණක් ..... රැස් වෙයි.
3. සිත, කය, ...යනු කර්ම සිදුවන දොරටු ය.
4. කුසල කර්ම ..... ලෙස කර්මයෙහි ප්‍රධාන කොටස් දෙක කි.
5. ලෝභ, ද්වේශ, මෝහ යනු..... මූලයන් ය.
6. අලෝභ, අද්වේශ, අමෝහ යනු..... මූලයන් ය.
7. උතු නියාම, ...නියාම, ධම්ම නියාම, කම්ම නියාම, චිත්ත නියාම යනු පංච නියාම ධර්ම නම් වේ.
8. මුසාවාදය හෙවත් බොරු කීමෙන් වැළකීම .....සුචරිතයට අයත් වන්නකි.
9. රූප සෝභාව ඇති ව දුප්පත් තැනක උපත ලැබුව ද රූප සෝභාව නිසා දුප්පත්කම නැති වීම ..... යි
10. මරණාසන්න මොහොතේ සිදුකළ හෝ පෙර කරන ලද , මරණාසන්න මොහොතේ සිහියට නැගුණ කර්ම ..... කර්ම නම් වේ

(කර්ම, චුල්ලකම්මවිභංග, වචනය, උපධි සම්පත්තිය, අකුසල, බීජ, අකුසල කර්ම, සුභ මානවකයා, ආසන්න, කුසල, වාචසික,)

- **පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. **'කර්මය'** යන්න බුදු දහමට අනුව පැහැදිලි කරන්න.
2. බුදුරදුන් වදාළ පරිදි අකුසල කර්ම හෙවත් සසර දුක් උපදවන නරක අවැඩදායක සචේතනික ක්‍රියා දහයකි. එම දස අකුසල කර්ම තිදොරින් සිදුවන ආකාරය වෙන්කර දක්වන්න.
3. විපාක දෙන කාලය අනුව කර්මයේ ප්‍රභේද හතරකි. ඒවා නම්කර කෙටියෙන් හඳුන්වන්න.
4. **'කර්මය සත්ත්වයා උස් පහත් වශයෙන් බෙදයි'** පැහැදිලි කරන්න.
5. ඔබ විසින් සිදුකළ යහපත් ක්‍රියාවක් පිළිබඳව ඡේදයක් ලියන්න.